# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2459/03 – 2025 ඔක්තෝබර් මස 21 වැනි අඟහරුවාදා – 2025.10.21**

**(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)**


# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR/COM/02/2021/162.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වැනි පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වැනි වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව –

ඩබ්. එම්. පියසීලි මිය, දසිත, අලුත්වෙල උතුර, දියතලාව.

සහ

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය, අංක 200, කිරුළ පාර, කොළඹ 05.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

කම්කරු අමාත්‍ය ආචාර්ය අනිල් ජයන්ත ප්‍රනාන්දු වන මම, 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත් වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, බටුවත්ත, නාරංගොඩ පාළුව, අංක 501, නීතිඥ පාලිත සේනාධීර මයා පත්කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**ආචාර්ය අනිල් ජයන්ත ප්‍රනාන්දු,**
කම්කරු අමාත්‍ය.

2025 ඔක්තෝබර් මස 10 වැනි දින,
කොළඹ දී ය.




*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

මගේ අංකය: IR/COM/02/2021/162.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 අධිකාරය වන කාර්මික ආරාවුල් පනත
(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

ඩබ්. එම්. පියසීලි මිය, දසිත, අලුත්වෙල උතුර, දියතලාව.

සහ

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය, අංක 200, කිරුළ පාර, කොළඹ 05.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති කාර්මික ආරාවුලට හේතුවී පවත්නා කරුණ වනුයේ,

"ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ බණ්ඩාරවෙල ඩිපෝවේ සහකාර කළමනාකරු (මුදල්) වශයෙන් සේවයේ නියුතුව සිටි ඩබ්. එම්. පියසීලි මිය හට බණ්ඩාරවෙල රියදුරු අභ්‍යාස විද්‍යාලයේ පුහුණුවන ආධුනිකයන් වෙතින් රියදුරු පුහුණු ගාස්තු අයකිරීමේ වගකීම පැවරී තිබුනේද යන්නත් පුහුණු ගාස්තු අය නොකිරීම සම්බන්ධයෙන් ඇයට දඬුවම් මගින් අසාධාරණයක් සිදුවී තිබේ ද යන්නත් එසේ අසාධාරණයක් සිදුවී තිබේ නම් ඇයට හිමිවිය යුතු සහන කවරේද යන්නත් පිළිබඳව වේ."

**එච්. එම්. ඩී. එන්. කේ. වටලියද්ද,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2025 සැප්තැම්බර් මස 26 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් ජනරාල් තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

EOG 10 – 0192

---

මගේ අංකය: IR/COM/02/2024/66.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වැනි පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වැනි වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව –

ජේ. එච්. එම්. ආර්. ජයමහ මයා, අංක 107/ඩී/21, ආර්ලින්ටන් ග්‍රෝව්, කලල්ගොඩ පාර, පන්නිපිටිය.

සහ

ජාතික සංවර්ධන බැංකුව, අංක 40, නවම් මාවත, කොළඹ 02.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

කම්කරු අමාත්‍ය ආචාර්ය අනිල් ජයන්ත ප්‍රනාන්දු වන මම, 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත් වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් කළුතර, නාගොඩ, ශ්‍රී සෝභිත මාවත, අංක 242, නීතිඥ ඔබඩගේ ලීලාරත්න මයා පත්කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**ආචාර්ය අනිල් ජයන්ත ප්‍රනාන්දු,**
කම්කරු අමාත්‍ය.

2025 ඔක්තෝබර් මස 10 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය: IR/COM/02/2024/66.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 අධිකාරය වන කාර්මික ආරාවුල් පනත**
**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

ජේ. එච්. එම්. ආර්. ජයමහ මයා, අංක 107/ඩී/21, ආර්ලින්ටන් ග්‍රෝව්, කලල්ගොඩ පාර, පන්නිපිටිය.

සහ

ජාතික සංවර්ධන බැංකුව, අංක 40, නවම් මාවත, කොළඹ 02.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති කාර්මික ආරාවුලට හේතුවී පවත්නා කරුණ වනුයේ,

"ජාතික සංවර්ධන බැංකුවේ ප්‍රධාන කළමනාකරුවෙකු ලෙස සේවයේ නියුතුව සිටි ජේ. එච්. එම්. ආර්. ජයමහ මහතාගේ 2021 වසරට අදාළ කාර්ය සාධන ඇගයුම් කිරීමේ දී ඔහුව C ශ්‍රේණියේ ඇගයුමක් ලෙස වර්ගීකරණය කිරීමෙන් යම් අසාධාරණයක් සිදුවී තිබේද යන්න හා එසේ සිදුවී තිබේ නම් ඔහුට ලබාදිය යුතු සහනයන් කවරේද යන්නත් පිළිබඳව වේ."

**එච්. එම්. ඩී. එන්. කේ. වටලියද්ද,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2025 සැප්තැම්බර් මස 30 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් ජනරාල් තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

EOG 10 – 0193

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.